

# “බෙරහඬ” - සිහිනය මල්වර වීම

**ලක්ෂ්මී දමයන්තිගේ 'බෙරහඬ' වේදිකා නාට්‍ය නිර්මාණය මේ මස 23 වැනි ඉරිදා පස්වරුවේ මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී වේදිකාගතවේ. මෙය නාට්‍යවේදී බන්දුල ජයවර්ධනගේ 'බෙරහඬ' මුල් නාට්‍ය නිෂ්පාදනයේ දෙවැනි නාට්‍ය නිෂ්පාදනයයි.**

1966 වසරේ දයානන්ද ගුණවර්ධන 'ආනන්ද ජවනිකා' යනුවෙන් වේදිකා නාටකයක් නිෂ්පාදනය කෙළේය. ඔහු එහි දී නවක රංගන ශිල්පිනියකට අවස්ථාවක් ලබා දුන්නේය. ඕ ලක්ෂ්මී දමයන්තිය. එතැන් පටන් ඇය ශ්‍රී ලාංකීය වේදිකා නාටක කලාව අතික්‍රමණය කරමින් පැහැදිලි අනන්‍යතාවක් ගොඩ නඟා ගත්තීය.

ලක්ෂ්මී දමයන්ති දයානන්ද ගුණවර්ධනගේ 'නාරිබෑනා' නාටකයේ ගම දියණිය වූවාය. එතැන් සිට වසර 17ක් ඒ සඳහා ඇය තම රංගන දායකත්වය ලබාදුන්නීය. විජය නන්දසිරිගේ කුසපබාවතී, ප්‍රසන් මුලැත්සිංහලගේ 'රතු හැට්ටකාරී', ජයලත් මනෝරත්නගේ 'පදබිර', ධර්මසිරි බණ්ඩාරනායකගේ 'ට්‍රෝජන් කාන්තාවෝ' මංගල සේනානායකගේ 'ශ්‍රී මෙනෙවිය', රොඩ්නි වර්ණකුලගේ 'සාරංගා නැවත ඇවිත්' වැනි නාටක හරහා විවිධ චරිතයන් නිරූපණය කරමින් ලක්ෂ්මී දමයන්ති ප්‍රේක්ෂකාගාරය රසභාවයන්ගෙන් පෝෂණය කළාය. ඕ අද දීර්ඝ විසිවසරක් පසුරෙන සිය නාටක ජීවිතය පිළිබඳව මහත් උද්දාමයට පත්ව සිටින්නීය.

'මගේ ජීවිතය පුරා මා සිහිනයක් දකිමින් සිටියා'

'සිහිනයක්?'

'ඔව්! බොහෝ සුන්දර සිහිනයක්'

'ඔබ සිතන්නෙ මොකක් කියලද?'

'ම.....මට මුහුණත් හිනාගන්න බෑ'

'මගේ සිහිනය.....

වේදිකා නාට්‍යයක් නිෂ්පාදනය කිරීම'

ලක්ෂ්මී දමයන්තියගේ සිහිනය අද ඇගේ දෙනෙත් අභිමුව සැබෑවක් ව ඇත. 'බෙරහඬ' ඕ නිරතුරුවම දුටු සුන්දර සිහිනයයි.

'ඔව්! සිහිනය අද සැබෑවක් වෙලා'

කැලණිය විශ්වවිද්‍යාලයීය නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති උපාධිය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඇය 'බෙරහඬ' නාටකය නිෂ්පාදනය කළාය. එහි මුල් නිෂ්පාදනය නාට්‍යවේදී බන්දුල ජයවර්ධනගෙනි. 'බෙරහඬ' නාට්‍ය පෙළ ලබාදීම සම්බන්ධයෙන් ඇය බන්දුල ජයවර්ධන මැතිණිය වෙත සිය ප්‍රණාමය පුදකරන්නට අමතක කළේ නැත. එසේ ම ඕ 'බෙරහඬ' නිර්මාතා වෙත ද තම කෘත ගුණ පුද කර සිටියාය.

මේ මස 23 වැනි ඉරිදා සවස මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී ප්‍රොසීනියම් වේදිකාව මත දී තම සුන්දර සිහිනය මල්වර වේ. 'බෙරහඬ' වේදිකා නාටකයෙහි රංග කාර්යයෙන් සක් රජ ලෙස සරත් කොතලාවලත්, බිරු රජ ලෙස - රවීඩ් මාගමුදලිත්, සිඳගත ලෙස - ලක්ෂ්මී දමයන්තිත්, පංචසිව - වෙළෙන්ද නායක ලෙස ප්‍රදර්ශන බණ්ඩාරත් අනෙකුත් අවශේෂ භූමිකා සඳහා ඉන්දික ජයසිංහත්, ප්‍රසාද් මහේන්ද්‍රත් දායක වෙති. සංගීත අධ්‍යක්ෂණය තරුපති මුණසිංහගෙනි. නර්තන නිර්මාණය - විදාරත්න ප්‍රනාන්දු විසිනි. අංග රචනය ප්‍රමෝද් හේවාවිතාරණගෙනි. ඇඳුම් නිර්මාණයෙන් සුවිනීතා පෙරේරාත්, ශබ්ද පරිපාලනයෙන් සංජීව උපේන්ද්‍රත්, පසුතල නිර්මාණයෙන් තිසවිගල ප්‍රේමදාසත් පෙළමිනක් කිරීමෙන් සුජීව නිසංකත් රචනයෙන් බන්දුල ජයවර්ධනත් 'බෙරහඬට' දායක වෙති.

'ඔබේ සිහිනය ගැන මොකවද අද කියන්නේ?'

'ඔබ ඇවිත් බලන්න'

අනුසාර